රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 157

මගේ අංකය: /9/776(ට),
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7. 80.01. 25

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ
සංස්ථා ප්‍රධානයන් වෙත.

**පරිශ්‍රය ඇතුළත විරෝධතා ව්‍යාපාරවල(පිකටිං) යෙදීම**

අංක.156 සහ 1980 ජනවාරි 17 වන දිනය දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතරවය. පහත සඳහන් පරිදි ද ක්‍රියා කළයුතු වේ.

(අ) කවර රාජ්‍ය හෝ රජයේ ආයතනයක හෝ භූමි භාගයක් තුළ පිකටින් ව්‍යාපාරය පැවැත්වීමට තැත් කරන පිකටින් ව්‍යාපාරිකයින්ට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කළයුතුය.

(ආ) ගොඩනැගිල්ලක සීමාව තුළ දේපළවලට අලාභහානි කිරීමක් හෝ සාමය කඩකිරීමක් හෝ වෙනත් කවර හෝ සාපරාධී වරදක් සිදුකළහොත් හෝ එසේ සිදුවෙතැයි අපේක්ෂා කළහොත් එම කරුණ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා ආයතනයේ ප්‍රධානයා හෝ වෙනත් වගකිව යුතු නිලධරයකු පොලිසිය කැඳවිය යුතුය; ගොඩනැගිල්ලක සිට, දේපළවලට අලාභහානි සිදුවිය හැකි අන්දමේ හෝ පුද්ගලයින්ට තුවාල සිදුවිය හැකි අන්දමේ හෝ ගල් ගැසීම් හෝ ද්‍රව්‍ය විසිකිරීම, වැනි ක්‍රියා සම්බන්ධයෙන් පිකටින් ව්‍යාපාරිකයින් නීතිය උල්ලංඝනය කරන ලද බවට පොලිසිය සොයා ගතහොත් පොලිසිය එලෙසම ක්‍රියා කළ යුතුය.

(ඇ) රාජ්‍ය හෝ රජයේ ආයතනයක භූමි භාගයකින් පිටත පැවැත්වෙන පිකටින් ව්‍යාපාර සම්බන්ධයෙන්, එසේ පිකටින් ව්‍යාපාරයෙහි යෙදීම මහජනයාට අවහිරයක් විය හැකි බැවින් පොලිසිය, එක් ස්ථානයක රැඳී නොසිට ගමන් කිරීමේ නීතිය ක්‍රියාත්මක කළ යුතුය.

Siriwardhana
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ ලේකම්.